# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශේෂ

අංක 2262/45 - 2022 ජනවාරි මස 13 වැනි බ්‍රහස්පතින්දා - 2022.01.13

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

### ශ්‍රී ලංකා විදුහල්පති සේවය, ගුරු උපදේශක සේවය හා ශ්‍රී ලංකා ගුරු සේවය සංවෘත සේවාවන් බවට පත් කිරීම

ශ්‍රී ලංකා විදුහල්පති සේවය, ගුරු උපදේශක සේවය හා ශ්‍රී ලංකා ගුරු සේවය 2021.08.30 වැනි දින සිට ක්‍රියාත්මක වන පරිදි පහත දැක්වෙන විධිවිධානයන්ට යටත්ව වෙන් වෙන් වශයෙන් සංවෘත සේවාවන් තුනක් බවට පත් කරනු ලැබේ.

රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ එකඟතාවය පරිදි,

**මහාචාර්ය කේ. කපිල සී. කේ. පෙරේරා,**
ලේකම්,
අධ්‍යාපන අමාත්‍යාංශය.

2022 ජනවාරි මස 12 වැනි දින,
බත්තරමුල්ල,
පැලවත්ත,
"ඉසුරුපාය",
අධ්‍යාපන අමාත්‍යාංශයේ දී ය.

**1. ක්‍රියාත්මකවන දිනය**

මෙම සේවාවන් සංවෘත සේවාවන් බවට පත් කිරීම 2021.08.30 වැනි දින සිට ක්‍රියාත්මක වේ.

**2. පත් කිරීම් බලධරයා**

පත්කිරීම්, උසස් කිරීම්, විනය, ස්ථාන මාරු හා අනෙකුත් ආයතන කටයුතු සම්බන්ධයෙන් වන බලතල හා විධිවිධාන ඒ ඒ සේවාවන් සඳහා දැනට ක්‍රියාත්මක අයුරින්ම ඉදිරියටත් බල පැවැත්වේ.


1A - G 35827 — 45 (2022/01)
මෙම අති විශේෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

3. වැටුප්

ඒ ඒ සේවාවන්ට අනන්‍ය වූ විශේෂිත වැටුප් ව්‍යුහයන් පිළිබඳ අදාළ බලධාරීන් විමසා සුදුසු පරිදි සංශෝධනය කර ගත යුතු වේ.

**4. තනතුරු, සේවා ගණ, ශ්‍රේණි, සේවයට අයත් තනතුරු සංඛ්‍යාව, බඳවා ගැනීම හා උසස් කිරීම් සිදු කිරීම**

සේවා ගණ, ශ්‍රේණි හා තනතුරු සම්බන්ධයෙන් අදාළ බලධාරීන් විසින් අනුමත කරනු ලබන නව ප්‍රතිපාදනයන් අනුව සේවා ව්‍යවස්ථාවන් සකස්කර *ගැසට් පත්‍රයේ* ප්‍රසිද්ධ කිරීමට කටයුතු කරන තෙක් ඒ ඒ සේවාවන් සඳහා දැනටමත් ක්‍රියාත්මකව පවතින සේවා ව්‍යවස්ථාවල සඳහන් විධිවිධානයන් අදාළ වේ.

EOG 1 - 0151

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.